# මගී සේවා අවසර පත්‍ර කොන්දේසි

1. මගී සේවා අවසර පත්‍රයෙන් බලය දී ඇති බස්රථය ධාවනය කිරීමේ වගකීම කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය නොමැතිව වෙනත් යම් තැනැත්තෙකුට භාරකර නොමැති බවට,
2. මගී සේවා අවසර පත්‍රයේ අයිතිකරුගේ සම්බන්ධීකරණ විස්තර වල යම් වෙනස් කිරීමක් සිදුවුවහොත් ඒ වෙනස් කිරීමෙන් වැඩකරන දින තුනක් ඇතුළත ඒ විස්තර කොමිෂන් සභාවට දැනුම් දෙන බවට,
3. මගී සේවා අවසර පත්‍රයේ අනෙකුත් විස්තර වල ඕනෑම වෙනස් කිරීමක් කොමිෂන් සභාවේ පූර්ණ අනුමැතියට යටත්ව සිදු කරන බවට,
4. බස්රථය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් වරින් වර නිශ්චිතව සඳහන් කරනු ලබන මගීන් හා තුන්වන පාර්ශවය සඳහා වූ අතිරේක රක්ෂණ ආවරණයක් සියලු අවස්ථා වලදීම බලාත්මකව පවතින බවට,
5. සෑම අවස්ථාවකදීම ඕම්නි බස්රථය, ව්‍යාපාර පැවැත්වීම හා බස්රථයේ සේවකයන් නියෝජිතයන් සේවා නියුක්ත කිරීමට අදාල ශ්‍රී ලංකාවේ වලංගු ඕනෑම ලිඛිත නීතියකට අනුකූලව කටයුතු කරන බවට,
6. අවසර පත්‍රය යටතේ බලය දී ඇති බස්රථය ඇතුළත ක්‍රියාත්මක කළ හැකි ගිනි නිවීමේ උපකරණයක් සවිකර ඇති බවට,
7. අවසර පත්‍රය යටතේ බලය දී ඇති බස්රථය ඇතුළත ක්‍රියාත්මක ඔරලෝසුවක් සවිකර ඇති බවට,
8. බස්රථයේ ඉදිරිපස හා පසුපස කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද හෝ නිකුත් කරන ලද ආකෘතියෙහි වූ හඳුනා ගැනීමේ ස්ටිකරයක් තිබිය යුතු බවට,
9. ජාතික බස් ගාස්තු ප්‍රතිපත්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බස් ගාස්තු සටහන බස්රථය ඇතුළත ප්‍රකට ලෙස ප්‍රදර්ශනය කර ඇති බවට හා ගමන සඳහා අනුමත ගාස්තුව ඉක්මවන ගාස්තුවක් අය නොකරන බවට,
10. බස්රථ සේවය කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන කාලසටහනට අනුකූලව ධාවනය කරන බවට සහ අපේක්ෂිත පිටත්වීමේ වේලාව හා ගමනාන්තයට යන වේලාව බස්රථය ඇතුළත ප්‍රකටව ප්‍රදර්ශනය කර ඇති බවට,
11. බස්රථය සියලු අවස්ථාවලදීම යාන්ත්‍රික වශයෙන් සුදුසු පිරිසිදු හා සේවය කළ හැකි තත්වයකින් පවත්වා ගෙන යන බවට,
12. බස්රථය වාර්ෂික පරීක්ෂණයකට යටත් කර ඇති බවට වගබලාගත යුතුය. මේ සඳහා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන අකෘතියකට අනුකූලව බලයලත් ගරාජයකින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කරන බවට,

13. බස්රථ වල සවිකර ඇති දොරවල් වීදුරු කොටස හා වාමුවා වීදුරු පාට කර හෝ පින්තාරු කර නොමැති බවට හා ස්ටිකර් අලවා නොමැති බවට,
14. මගීන්ට පහසුවෙන් ප්‍රවේශයක් තිබෙන යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ආකාරයෙන් ක්‍රියාත්මක වන සීනුවක් බස්රථය ඇතුළත සවිකර ඇති බවට,
15. කොමිෂන් සභාවේ අනුමැතියක් නොලද අතිරේක සවි කිරීම් කිසිවක් බස්රථයේ නොමැති බවට,
16. අවසර පත්‍රය දරන තැනැත්තාගේ නම, තැපැල් ලිපිනය, දුරකථන අංකය සහ බස්රථය ධාවනය කිරීමට අනුමත අවසර පත්‍ර අංකයද කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ආකාරයට බස්රථයේ පසුපස පාපුවරුව සහ බස්රථයේ අවසාන කෙළවර අතර කළු පසුබිමක සුදුපැහැති අකුරු වලින් පැහැදිලිව මුද්‍රණය කර හෝ ලියා ඇති බවට,
17. බස්රථය බස්නැවතුමේ සිට පිටත්වීමට පෙරාතුව  සියලුම මගීන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කර ඇති බවට,
18. යම් ලිඛිත නීතියක් යටතේ නියම කර ඇති හා බස්රථ සම්බන්ධයෙන් අදාළ වන වේග සීමා සියලු අවස්ථා වලදී පිළිපදින බවට සහ බස්රථය නොසැලකිළිමත් ලෙස හෝ අනතුරුදායක ලෙස ධාවනය නොකරවන බවට,
19. බස්රථයෙහි පිළිවෙලින් පූජ්‍ය පක්ෂයේ, ආබාධිත තැනැත්තන්ගේ හා ගර්භනී කාන්තාවන්ගේ තනි පාවිච්චිය සඳහා ආසන දෙක බැගින් වෙන්කර ඇති බවට වගබලා ගත යුතුය. මේ ආසන ඒවා වෙන් කර ඇති මගී කොට්ඨාසයන් බස්රථයේ ගමන් නොකරන අවස්ථා වලදී පමණක් වෙනත් මගීන් විසින් පාවිච්චි කරන බවට කොන්දොස්තරවරයා වග බලාගත යුතු බවට,
20. බස්රථය තුළ රේඩියොව හැර වෙනත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ භාවිත නොකරන බවට,
21. අවසරපත්‍රය මගින් අනුමත නොකරන ලද බස්රථයේ සේවාව හා ගමනනාන්තය හඳුනා ගැනීමට පහසු ලෙසට කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආකෘතියෙහි පරිදි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් ලොකු අකුරු වලින් ප්‍රකට ලෙස ප්‍රදර්ශනය කර ඇති බවට,
22. අවසර පත්‍රය යටතේ අනුමත කරන ලද බස්රථයේ ලියාපදිංචි අංකය බස්රථය ඇතුළත ප්‍රකටව පෙනෙන ස්ථානයක උසින් එක් අඟලකට අඩු නොවන පරිදි පින්තාරු හෝ මුද්‍රණය කර ඇති බවට,
23. බස්රථය ඉදිරිපස හා පසුපස පිටත තනි පාටකින් පින්තාරු කර ඇති බවට සහ බස්රථයේ ලියාපදිංචි අංකය හා මේ නියෝගය යටතේ අනුමත කරන ලද වෙනත් ප්‍රදර්ශන හැර වෙනත් ලිවීම් වලින් හෝ ඇඳීම් වලින් තොර බවට,
24. බස්රථයෙහි ප්‍රථමාධාර පෙට්ටියක් සවිකර ඇති බවට හා ඒ පෙට්ටියෙහි ප්‍රථමාධාර ප්‍රතිකාර ද්‍රව්‍ය හා උපකරණ සියලු අවස්ථා වලදී තිබෙන බවට,

25. ධාවනය වන බස්රථය ඇතුළත මගීන් සඳහා වෙන් කර ඇති යම් ප්‍රදේශයක ශබ්ද මට්ටම කිසිම අවස්ථාවකදී කොමිෂන් සභාව විසින් නියම කර ඇති ශබ්ද මට්ටම නොඉක්ම විය යුතු බවට,
26. ධාවනය කරන මාසය සම්බන්ධයෙන් වන ධාවන දත්ත වලට අදාල තොරතුරු කොමිෂන් සභාව විසින් නියම කර ඇති ආකෘති පත්‍රයෙහි ඊළඟ මාසයෙහි පහලොස්වන දිනය ඉකුත් වීමට පෙර කොමිෂන් සභාවට සපයන බවට හා ඒ වාර්තා මාස හයක කාලයක් සුරක්ෂිතව තබා ඇති බවට,
27. බස්රථයෙහි සේවයට යොදවා ඇති රියදුරු හා කොන්දොස්තර විසින් ඉටු කරන කාර්ය පිළිබඳ සටහන් තැබීම පිණිස කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලොග් පත්‍රයක් සෑම විටම බස්රථයෙහි තබා ගෙන ඇති බවට,
28. අවසර පත්‍රයෙන් අනුමත කර ඇති බස්රථය සම්බන්ධයෙන් වන මාර්ග හදිසි අනතුරු හේතුවෙන් බස්රථය ප්‍රමාද වීම, කාල සටහනට අනුව යායුතු ගමන ඇන හිටීම, බස්රථය පොලිස් අත්අඩංගුවට ගැනීම, අයිතිකරුට/රියදුරුට විරුද්ධව පොලීසිය විසින් ක්‍රියාකර තිබීම වැනි අවස්ථා වල ඒ පිළිබඳ විස්තර කොමිෂන් සභාව විසින් නියම කර ඇති ආකෘතියට අනුව දින හතක් ඇතුළත කොමිෂන් සභාව වෙත දැනුම් දෙන බවට,
29. නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර පිළිබඳව වාර්තාවක්, ඒ ප්‍රවේශ පත්‍ර නිකුත් කරන ලද දිනයේ සිට මාස තුනක කාලයක් තබා ගැනීමට හා ඒවා සුරක්ෂිත කිරීමට වගබලා ගන්නා බවට,
30. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු "ඒ" පන්තියේ රියදුරු බලපත්‍රයක් බස්රථය ධාවනය කිරීමට සේවයේ නියුක්ත කර ඇති රියදුරුට තිබෙන බවට හා ඒ බලපත්‍රය ඔහු රැගෙන යන බවට,
31. ජාතික ගමනාගමන වෛද්‍ය ආයතනය විසින් නිකුත් කරන ලද වලංගු වෛද්‍ය යෝග්‍යතා සහතිකයක් බස්රථය ධාවනය කිරීමට සේවයේ නියුක්ත කර ඇති රියදුරුට තිබෙන බවට හා ඒ බලපත්‍රය ඔහු රැගෙන යන බවට,
32. බස්රථය ධාවනය කිරීමට සේවයේ නියුක්ත කර ඇති රියදුරු හා කොන්දොස්තර යහපත් චරිතයකින් හා මනා හැසිරීමෙන් යුතු මගීන්ට හා මහජනතාවට කාරුණික හා විනීත තැනැත්තෙකු බවට සහ මත්පැන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි නොවූ අයෙකු බවට,
33. බස්රථයේ සේවයේ නියුක්ත කර ඇති රියදුරුට හා කොන්දොස්තරවරයාට කොමිෂන් සභාවේ වලංගු ලියාපදිංචි කිරීමක් තිබෙන බවට හා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද එම ලියාපදිංචි කිරීමේ අනන්‍යතා පත්‍රය පැළඳ සිටින බවට මෙන්ම එම ලියාපදිංචි කිරීමේ අංක බස්රථය තුළ ප්‍රකටව ප්‍රදර්ශනය කළ යුතු බවට,
34. බස්රථයෙහි සේවයේ නියුක්ත කර ඇති රියදුරු හා කොන්දොස්තර කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඇඳුම් පිළිබඳ නීති සංග්‍රහ අනුව ක්‍රියා කරන බවට හෝ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සේව්‍යයා විසින් ලබා දෙන නිල ඇඳුම් හැඳ සිටින බවට,

35. සාමාන්‍ය ගාස්තු සේවා බස්රථ වල පමණක් සිටගෙන සිටින මගීන් ගෙන යන්නේ නම් අවසර පත්‍රය යටතේ අනුමත කරන ලද උපරිම මගී සංඛ්‍යාව නොඉක්මවන පරිදි බස්රථයේ ආසන පේළි දෙක අතර ඇති ඉඩ ප්‍රදේශයෙහි පමණක් එම මගීන් ගෙන යන බවට,

36. සාමාන්‍ය බස්ගාස්තු සේවා නොවන සියලු සේවා වල අවසර පත්‍රයකින් අනුමත කරන ලද මගී සංඛ්‍යාව නොඉක්ම වන ආසන ගත මගීන් පමණක් ගෙන යන බවට,

37. අවසර පත්‍රය යටතේ නිශ්චිත වශයෙන් බලය දී ඇති බස්රථ නැවතුම් වලදී පමණක් මගීන් බස්රථයට නංවා ගන්නා බවට හා බස්රථයෙන් බස්සවන බවට

38. කොමිෂන් සභාව විසින් විධාන කර ඇති පරිදි බස්රථය ඇතුළත දුම්පානය තහනම් කරන දැන්වීමක් ප්‍රකටව ප්‍රදර්ශනය කර ඇති බවට හා ඒ තහනම් කිරීම කොන්දොස්තරවරයා විසින් දැඩි ලෙස ක්‍රියාත්මක කරන බවට,

39. අවසර පත්‍රයේ අධිකාරය යටතේ ධාවනය කරන බස්රථයේ දොරවල් බස්රථය ධාවනය කෙරෙන අතරතුර වසා තිබෙන බවට,

40. අවසර පත්‍රයේ විශේෂ අනුමැතියක් පිටසන්කර ඇත්නම් මිස එක් කොන්දොස්තරවරයෙකු පමණක් බස්රථයක සේවයේ යොදවා ඇති බවට සහ එම කොන්දොස්තරවරයා විසින් බස්රථයට නංවා ගැනීම සඳහා බස්රථයක ගමන් කිරීමට බලාපොරොත්තුවෙන් සිටින මහජනතාව යොමු කර ගැනීම සඳහා කෑගසා හෝ වෙනත් අන්දමකින් පෙළඹවීමක් නොකරනු ලබන බවට,

41. සිඟමනෙහි හා වෙළඳාමෙහි යෙදී සිටින තැනැත්තන්ට බස්රථය ඇතුළතට ඒමට අවසර නොදෙන බවට හා මේ තහනම් කිරීම කොන්දොස්තරවරයා විසින් දැඩි ලෙස ක්‍රියාත්මක කරන බවට,

42. කොන්දොස්තරවරයා විසින් බස්රථයේ ලියාපදිංචි අංකය, ගමන ආරම්භ කරන ලද ස්ථානය, ගමනාන්තය හා මගියා විසින් ගෙවන ලද ගාස්තුව පැහැදිලිව ලියා හෝ මුද්‍රණය කර ඇති අනුක්‍රමික අංක යෙදූ ප්‍රවේශ පත්‍රයක් සෑම මගියෙකුට ම නිකුත් කරන බවට,

43. අවසර පත්‍රය යටතේ බලය ලබා දී ඇති බස්රථය කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව ගමනාන්තයට ලඟා වීමට ප්‍රමාණවත් ඉන්ධන නොමැතිව, අවසර පත්‍රය යටතේ බලය දී ඇති ගමන ආරම්භ නොකරන බවට,

44. ඔම්නි බස්රථය තුළ GPS උපකරණ / උපාංග සවි කිරීම අනිවාර්ය වන අතර ඒ සම්බන්ධයෙන්,

    (i) අදාල GPS උපකරණ / උපාංග සවි කිරීමට කොමිෂන් සභාව / කොමිෂන් සභාවේ බලය ලද ආයතන වලට ඉඩ සලසා දෙන බවට,

    (ii) සවි කරන ලද GPS උපකරණ / උපාංග සම්බන්ධයෙන් සිදුවිය හැකි අලාභ හානි වළක්වා ගැනීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂාව සපයන බවට,

    (iii) GPS උපකරණ / උපාංග සවි කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාල පිරිවැය හෝ ඉන් කොටසක් කොමිෂන් සභාව නියම කරන ආකාරයට දරන බවට,

(iv) සවි කරන ලද GPS උපකරණ / උපාංග වල මුද්‍රා කැඩීම (හෝ අලුත්වැඩියා කටයුතු කිරීම) අවසර පත්‍ර හිමිකරු හෝ ඔහුගේ සේවකයන් විසින් නොකරන බවට,

(v) තම බස්රථයේ විදුලි පද්ධතිය ඉතා හොඳ තත්වයේ තිබිය යුතු අතර, සවි කරන ලද GPS උපකරණ / උපාංග නිසි ක්‍රියාකාරීත්වයෙන් තබා ගැනීමට ප්‍රමාණවත් බැටරි බලයක් තම බස්රථය සතුව තබා ගන්නා බවට,

(vi) බස්රථය විකිණීම හෝ සංශෝධන කටයුතු හෝ ප්‍රධාන මට්ටමේ නඩත්තු හෝ අලුත්වැඩියා කටයුතු කිරීම කොමිෂන් සභාවේ පූර්ව සහ පූර්ණ අනුමැතිය සහිතව සිදු කරන බවට,

(vii) කොමිෂන් සභාවට හෝ එහි බලයලත් නිළධාරීන්ට අවශ්‍ය වූ විටෙක අදාල GPS උපකරණ / උපාංග පරීක්ෂා කිරීමට ඉඩ සලසා දෙන බවට,

(viii) මෙම අවසර පත්‍ර කොන්දේසියට අදාල ඉහත කරුණු බැහැර හැරීම හෝ කඩ කිරීම තුළින් යම් ආකාරයක නැවත සවි කිරීමක් කළ යුතු වුවහොත් අදාළ පිරිවැයද අවසර පත්‍ර හිමියා විසින් දරන බවට,මගී සේවා අවසර පත්‍ර හිමිකරු සහතික විය යුතුය.